සැ. යු. - 2025.09.20 දින පළ කරන ලද අංක 2456 ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවේය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,457 - 2025 ඔක්තෝබර් මස 03 වැනි සිකුරාදා - 2025.10.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇැබෑර්තු ... ... | 2210 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 2217 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ඔක්තෝබර් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ*).

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරින්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරිහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරින්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සැම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත්වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඵ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිළිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ
පළාත් සභා සහ පළාත් පාලන අංශයේ
නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර
සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම -2025

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් සභා සහ පළාත් පාලන අංශයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩුව (01) සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගැනීමේ ක්‍රමය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත, මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ලැබේ.

**02. අවශ්‍ය සුදුසුකම් :**

(I) *අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්* :

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම ;

(II) *පළපුරුද්ද* :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම්දීමෙන් පසු නීතිඥවරයෙකු වශයෙන් වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.(සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය සහතික කරන්නාගේ නිලමුද්‍රාව හා සහතික කළ දිනය පැහැදිළිව සඳහන් කර තිබිය යුතුය.) ;

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිව්රුම්දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක* වසර තුනකට (03) නොඅඩු පළපුරුද්ද ලබා තිබීම.
(ලේකම්/ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානී විසින් නිකුත් කළ ලිපියකින් සනාථ කර තිබිය යුතුය.)

*සටහන* : මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය. සේවා කාලය ආරම්භවන හා අවසාන වන දිනය පැහැදිළිව සඳහන් සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

*නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක්වන තනතුරු ය.

(III) *කායික යෝග්‍යතාව* :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(IV) *වෙනත් සුදුසුකම්* :

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:**

(I) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(II) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(III) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතුය.

(IV) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද ඔබ යටත්විය යුතු වේ.

(V) අයදුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**05. වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**06. වැටුප් පරිමාණය :**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. **82,150–10×2,400 - 8×2,940 - 17×3,900 - රු. 195,970 (SL 1 – 2025)** වේ.

**06. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.**

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | *අතිරේක අධ්‍යාපන සුදුසුකම් :*<br>***සටහන*** : ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | 25 |
| | අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | |
| | ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් ; | 20 | |
| | ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගන්නා ලද | | |
| | • පළමු පන්තියේ සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | • දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | • පන්ති සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | • සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 05 | |
| | ඇ) නීති විද්‍යාලයේ අවසන් වසරේ පළමු පන්තියේ සාමාර්ථය | 10 | |
| | නීති විද්‍යාලයේ අවසන් වසරේ දෙවන පන්තියේ සාමාර්ථය | 05 | |
| | (***සටහන*** : නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05ක් ලබා දෙනු ලැබේ) | | |

<table>
<tr><th>අනු. අංකය</th><th>විෂයය</th><th>ලකුණු</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>02</td><td>අතිරේක පළපුරුද්ද :<br><br>නඩුවලට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම.<br><br>
<table>
<tr><th></th><th>නඩු ගොනු කිරීම් (එක් නඩුවක් සඳහා)</th><th>අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)</th></tr>
<tr><td>ශ්‍රේෂ්ඨාධිකරණය</td><td>2</td><td>5</td></tr>
<tr><td>අභියාචනාධිකරණය</td><td>2</td><td>4</td></tr>
<tr><td>මහාධිකරණය</td><td>2</td><td>3</td></tr>
<tr><td>දිස්ත්‍රික් උසාවිය</td><td>4</td><td>5</td></tr>
<tr><td>විනිශ්චයාධිකාර</td><td>2</td><td>3</td></tr>
</table>
<br>සටහන -<br>ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන් වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.</td><td></td><td>35</td></tr>
<tr><td>03</td><td>තොරතුරු තාක්ෂණය / තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම<br>සටහන : ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම.<br><br>ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබා ගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක්.<br><br>ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් හෝ වෙනත් ආයතනයකින් ලබා ගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්.<br><br>ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා / පුහුණු වැඩසටහන් වලට සහභාගි වී ලබා ගත් සහතික පත්‍ර ( එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබාදෙනු ලැබේ).</td><td><br><br><br>10<br><br><br>08<br><br><br><br>05<br><br><br><br><br>04</td><td>10</td></tr>
</table>

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 04 | *භාෂා හැකියාව* :<br>***සටහන*** : ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | 15 |
| | *අ)* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත්උපාධිය. | 15 | |
| | *ආ)* පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරගවල දී (Moot court competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව.<br><br>*කේවල*<br>(i) ප්‍රථම ස්ථානය / හොඳම කුසලතාව - 12<br>(ii) දෙවන ස්ථානය - 10<br>(iii) තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 08<br><br>*කණ්ඩායම්*<br>(i) ප්‍රථම ස්ථානය / හොඳම කුසලතාව - 10<br>(ii) දෙවන ස්ථානය - 08<br>(iii) තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 06 | 12 | |
| | *ඇ)* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින්/ රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500 ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක්. | 10 | |
| | *ඈ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)විභාගයේදී හෝ Edexcel හෝ Cambridge උසස් පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 02ක් ඇතුළත IELTS සමස්ත ලකුණු 6.5 (සෑම විෂයකටම අවම ලකුණු 6ක් සහිතව) හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ ලබා තිබීම. | 08 | |
| | *ඉ)* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතිකපත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක්. | 05 | |
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය :<br><br>තනතුරෙහි භූමිකාව ඉටුකිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ :<br>• ශක්තීන් (Strength questions) (ලකුණු 02)<br>• අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව (Situational questions) (ලකුණු 03) හා<br>• දක්ෂතාවය (Competency questions) (ලකුණු 10)<br>• ඇගයීමට ලක්කිරීම අරමුණු කරගත් ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | | 15 |
| | එකතුව | | 100 |

**07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය:**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා අයදුම්කරු විසින්ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(I) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**08. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය:**

(I) අයදුම්පත් **2025.11.03** වැනි දිනට හෝ ඊට ප්‍රථම **"ලේකම්, රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, පළාත් සභා සහ පළාත් පාලන අංශය, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(II) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස්කර මුල් පිටුව අංක 01 සිට 05 දක්වාත් දෙවන පිටුව 06 සිට 08 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(III) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(IV) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 82,150/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(V) දැනට රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම:**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10.** පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

**11.** මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

**12.** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ග තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්. ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන,පළාත් සභා
සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 සැප්තැම්බර් මස 22 දින

| |
|---|
| |

කාර්යාල ප්‍රයෝජනය සඳහා

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් සභා සහ පළාත් පාලන අංශයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහාවන අයදුම්පත්‍රය**

**01.** 1.1. මුලකුරු සමග නම : Mr./Mrs./Miss. ..............................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..............................................................................

1.2. සම්පූර්ණ නම : ..............................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..............................................................................

1.3. සම්පූර්ණ නම : ..............................................................................
(සිංහලෙන්)

**02.** 2.1. ස්ථිර ලිපිනය : ..............................................................................

2.2. දුරකථන අංකය :

ස්ථාවර : ........................................ ජංගම: ..............................................

**03.** 3.1. ජනවර්ගය : [ ]
( සිංහල-1, දෙමළ-2, මුස්ලිම්-3, වෙනත්-4)

3.2. ස්ත්‍රී/පුරුෂ භාවය :

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

3.3. විවාහක/අවිවාහක බව :

| | | | |
|---|---|---|---|
| විවාහක | | අවිවාහක | |

3.4. ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

3.5. උපන් දිනය :

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

3.6. 2025.11.03 දිනට වයස: අවුරුදු:........ මාස:........ දින:........

**04.** 4.1. අධ්‍යාපන සුදුසුකම්:

i. උපාධිය බලපැවැත්වෙන ලිපිය : ..............................................................................
ii. විශ්වවිද්‍යාලය / ආයතනය : ..............................................................................
iii. උපාධිය : ..............................................................................

4.2. වෘත්තිය සුදුසුකම් හා පළපුරුද්ද:

i. අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට ලබා ඇති සාමාර්ථය:
..............................................................................
ii. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් ලබා ඇති පළපුරුද්ද : වසර .....................

**05. යම් කිසි සාපරාධි වරදකට උසාවියේ දී චෝදනා ලබා තිබේ ද? එසේනම් දිනය හා නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සපයන්න.**
..............................................................................
..............................................................................

**06. අයදුම්කරුගේ සහතිකය:**

මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මම මෙයින් සනාථ කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුනහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමටද, මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසු ද එම වරද දැන ගැනීමට ලැබුනහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත්වන බව දනිමි.

දිනය : .................................... අයදුම්කරුගේ අත්සන: ............................................

**07. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:**

විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු.82,150/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .................................................................................................................... (සම්පූර්ණ නම) මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ..........................................දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

..................................................................
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය:........................................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ නම: ...........................................................................................
තනතුර: ......................................................................
ලිපිනය: ......................................................................
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

**08. ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන.......................................................................................................................................
....... (සම්පූර්ණ නම) මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් .........................................දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම, හැසිරීම.................................. බවත් ඔහු / ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් ලැබුවහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදා හැරිය හැකිය/නොහැකි බවත් සහතික කරමි.

.....................................................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන)

දිනය :...............................................................
නම:..................................................................
තනතුර:............................................................
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2025

## Open/Limited Competitive Examination for Recruitment to the Posts of Supervisory Management Assistant –Technical Service Category of Ministry of Education, Higher Education and Vocational Education - 2025

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය තුළ පුරප්පාඩුව පවතින,

ප්‍රවාහන නිලධාරි තනතුරු 01 ක්,
තාක්ෂණ නිලධාරි තනතුරු 03 ක්,
ගොඩනැගිලි පරීක්ෂක තනතුරු 03ක් හා
සැලසුම් ශිල්පී තනතුරු 04ක් සඳහා සහ
අමාත්‍යාංශය යටතේ පවතින ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළ පුරප්පාඩුව පවතින ගොඩනැගිලි පරීක්ෂක තනතුරු 19 ක් හා
ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර තනතුරු 20 ක් සඳහා

සීමිත හා විවෘත පදනමින් බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Applications – Recruitment Exams/ E.B. Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ඔක්තෝබර් මස 07 වැනි දින පෙ.ව 09.00** ට විවෘතවන අතර **2025 නොවැම්බර් මස 04 වැනි දින රාත්‍රී 09.00** ට අවසන් වේ.

විභාගය **2026 ජනවාරි මාසයේ දී කොළඹ දී** පැවැත්වේ.

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**01. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

1.1 මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.)

1.2 වැටුප් පරිමාණය : මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN 03-2025
**රු. 52,250 - 10x800 – 11x1190 – 10x1320 -10x1350 – රු.100,040** ක (මාසික)
වැටුප් පරිමාණයක් හිමි වේ. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් තලය රු. 52,250 /= ක් වේ.

1.3 ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05 ක දී ලබා ගත යුතු ය.

1.4 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**02. බඳවා ගැනීමේ ශ්‍රේණිය - III ශ්‍රේණිය**

**03. බඳවාගැනීමේ ක්‍රමය : මෙම තනතුර සඳහා බඳවාගැනීම් විවෘත හා සීමිත ධාරාවන් යටතේ සිදුකරනු ලැබේ.**

3.1 බඳවාගැනීමේ ප්‍රතිශත:

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |

3.2 පුරප්පාඩු පවතින සේවා ස්ථාන

3.2.1 අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය :

| ස්ථානය | ප්‍රවාහන නිලධාරි | තාක්ෂණ නිලධාරි | | ගොඩනැගිලි පරීක්ෂක | | සැලසුම් ශිල්පී | |
|---|---|---|---|---|---|---|---|
| අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය (ඉසුරුපාය පරිශ්‍රය) | විවෘත | විවෘත | සීමිත | විවෘත | සීමිත | විවෘත | සීමිත |
| | 01 | 02 | 01 | 02 | 01 | 03 | 01 |

3.2.2 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ :

| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | ගොඩනැගිලි පරීක්ෂක | ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර |
|---|---|---|---|
| 1 | මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 2 | සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 3 | සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, නිට්ටඹුව | 1 | 1 |
| 4 | දඹදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය , දඹදෙණිය | 1 | 1 |
| 5 | හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 6 | පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 7 | දර්ගා නගර් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 8 | රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 9 | නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 10 | රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 11 | ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 12 | මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 13 | පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | 1 |
| 14 | පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 15 | වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | - |
| 16 | තාක්ෂණවේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, කුලියාපිටිය | - | 1 |
| 17 | ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 18 | මඩකලපුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 19 | අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 20 | වවුනියා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 21 | යාපනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| | එකතුව | 19 | 20 |

3.3 විවෘත හෝ සීමිත ධාරා යටතේ උපරිමය තනතුරු 03 ක් දක්වා ඉල්ලුම් කළ හැක.

3.4 ගොඩනැගිලි පරීක්ෂක සහ ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර යන තනතුරු සඳහා ඉල්ලුම්කරන අයදුම්කරුවන් වෙත සේවා ස්ථානය, ඉල්ලුම්කරනු ලබන ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව ලබාදෙනු ලබන අතර එක් අයදුම්කරුවකුට සේවා ස්ථාන 03 ක් සඳහා ප්‍රමුඛතාව අනුව ඉල්ලුම් කළ හැකිය.

3.5 සේවා ස්ථාන සඳහා ස්ථානගත කිරීමේ දී සීමිත හෝ විවෘත තරග විභාගයෙන් ඉහළ ලකුණු ලබාගැනීමේ අනුපිළිවෙළට අයදුම්කරුවන්ගේ ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාව ලබාදෙනු ලැබේ.

3.6 සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මගින්ම තෝරාගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන් ම සම්පූර්ණ කරගැනීමට කටයුතු කරනු ලැබේ.

**04. විවෘත බඳවාගැනීම :**

4.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව මෙම තනතුරට පත්වීම් ලබන නිලධරයකු වසර 03 ක පරිවාස කාලයකට යටත්වන අතර එම කාලය ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

4.2 රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් මෙම තනතුරට පත්වීම් ලබන නිලධරයන්ට පමණක් වසර 03ක් තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව වසර 05 ක් ඇතුළත ලබාගත යුතුය.

4.3 බඳවා ගැනීමේ සුදුසුකම් :

4.3.1 අධ්‍යාපන සුදුසුකම්:

(*අ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් 2 ක් සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම ;

*සහ*

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය හා තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

4.3.2.වෘත්තීය සුදුසුකම් :

***(අ) ගොඩනැගිලි පරීක්ෂක , තාක්ෂණික නිලධාරි සහ ප්‍රවාහන නිලධාරි තනතුරු සඳහා :***

මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව ;

*හෝ*

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව ;

*හෝ*

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව ;

*හෝ*

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ;

*හෝ*

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ;

*හෝ*

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

***(ආ) සැලසුම් ශිල්පී තනතුර සඳහා :***

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;

හෝ

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*(ඇ) ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර සඳහා :*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;

*හෝ*

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

4.3.3 පළපුරුද්ද: අදාළ නොවේ.

4.3.4 වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා 2025 ඔක්තෝබර් මස 06 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**05. සීමිත බඳවා ගැනීම :**

5.1 අධ්‍යාපන අමාත්‍යාංශය තුළ දෙපාර්තමේන්තුගත පත්වීම් දරනු ලබන පහත සුදුසුකම් සපුරනු ලබන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

5.1.1 බඳවා ගැනීමේ සුදුසුකම් :

5.1.1.1 අධ්‍යාපන සුදුසුකම්:

(අ) සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් සමත්වීම.

5.1.1.2 වෘත්තීය සුදුසුකම් :

*(අ) ගොඩනැගිලි පරීක්ෂක, තාක්ෂණික නිලධාරි තනතුරු සඳහා*

මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව ;

*හෝ*

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව ;

*හෝ*

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ;

*හෝ*

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ;

*හෝ*

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*(ආ) සැලසුම් ශිල්පී තනතුර සඳහා:*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;

*හෝ*

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*(ඇ) ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර තනතුර සඳහා :*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;

*හෝ*

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.1.2 ***පළපුරුද්ද*** : ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ශ්‍රේණියක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

5.1.3 **වයස් සීමාව**: අදාළ නොවේ.

5.2 වෙනත් සුදුසුකම් :

(i) පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හා අනුශාංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුයි.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහාවන ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබේනම් පමණි.

**06. කායික සුදුසුකම්:**

6.1 ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

6.2 මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් සමඟ අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

**07. වෙනත් සුදුසුකම් :**

7.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

7.2 අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

7.3 යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

7.4 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**08.** ***බඳවා ගැනීමේ ක්‍රමය*** **:** ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගෙන් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළට අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු බඳවා ගනු ලැබේ.

8.1 *ලිඛිත පරීක්ෂණය* : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක් මගින් ලකුණු ලබා දේ.

8.2 ලිඛිත පරීක්ෂණය සම්බන්ධ විස්තර :

| | *විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

8.3 විභාගය සඳහා ප්‍රධාන විෂය නිර්දේශය :

| | *විෂය ක්ෂේත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | • අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාලය කළමනාකරණය, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.<br><br>• බඳවා ගැනීමේ දී සලකා බලනු ලබන අධ්‍යාපන සුදුසුකම් අනුව සීමිත විභාගය සඳහා සහ විවෘත විභාගය සඳහා වෙන් වෙන් වශයෙන් වූ බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර දෙකක් සැකසේ. |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | • තනතුරට අදාළ තාක්ෂණික දැනුම මැන බැලෙන ප්‍රශ්නවලින් සමන්විත කොටස් දෙකකින් යුත් ප්‍රශ්න පත්‍රයකි.<br><br>• පහත සඳහන් තනතුරු සඳහා පැවරී ඇති කාර්යයන්වලට අදාළව විෂයානුබද්ධ තාක්ෂණික දැනීම පරීක්ෂා කෙරේ. |

8.4 තනතුරට අදාළ විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණ විෂය නිර්දේශය :

| *තනතුර* | *විෂය නිර්දේශය* |
|---|---|
| තාක්ෂණ නිලධාරි | 1. වැඩබිම් අධීක්ෂණය, වාර්තා කෙටුම්පත් කිරීම සහ නියාමනය<br>2. ඇස්තමේන්තුකරණය සඳහා අවශ්‍ය ක්ෂේත්‍ර දත්ත ලබාගැනීම<br>3. ක්ෂේත්‍ර දත්ත මත ඇස්තමේන්තු සැකසීම හා මිල ගණන් විශ්ලේෂණය<br>4.ප්‍රසම්පාදන කටයුතු<br>5. ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් සහ ඊට අදාළ තාක්ෂණික වාර්තා සැකසීම<br><br>ඉහත කාර්යයන්වලට අදාළ NVQ 6 මට්ටමේ දැනුම හා කාර්යයන්ට අදාළ විෂයානුබද්ධ තාක්ෂණික දැනුම පරීක්ෂා කෙරේ. |
| සැලසුම් ශිල්පී | 1. ඉංජිනේරු, වාස්තු විද්‍යාඥ සහ තාක්ෂණ නිලධාරින්ගේ අවශ්‍යතා/නිර්මාණ අනුව සැලසුම් සකස් කිරීම<br>2. ඇස්තමේන්තුවල හා ගෙවීම් බිල්පත්වල ගණිතානුකූල නිරවද්‍යභාවය පරීක්ෂා කිරීම<br>3. ඉදිකිරීම් ප්‍රගතිය කළමනාකරණය සඳහා සහාය වීම.<br><br>ඉහත කාර්යයන්ට අදාළ විෂයානුබද්ධ තාක්ෂණික දැනුම පරීක්ෂා කෙරේ. |
| ගොඩනැගිලි පරීක්ෂක | 1. ක්ෂේත්‍ර පරීක්ෂා සිදුකිරීම හා නිරීක්ෂණ/නිර්දේශ වාර්තා කිරීම සහ ක්ෂේත්‍ර මිනුම් කටයුතු හා වැඩබිම් අධීක්ෂණය<br>2. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව සිදුකිරීමට අවශ්‍ය පරිපූරක සේවා ලබාදීම<br>3. ඉදිකිරීම්වලට අදාළ ගෙවීම් සඳහා බිල්පත් පරීක්ෂාව හා නිර්දේශ කිරීම<br>4. ලංසු ලියවිලි කෙටුම්පත් කිරීම<br>5. තාක්ෂණ ඇගයුම් කමිටුවල සහ මිල ඇගයුම් කමිටුවල කාර්යයන් ඉටුකිරීම<br>6. කනිෂ්ඨ නිලධාරින් නියාමනය හා මෙහෙයවීම<br>7. පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂාව හා නිර්දේශය<br><br>ඉහත කාර්යයන්වලට අදාළ NVQ 6 මට්ටමේ දැනුම හා කාර්යයන්ට අදාළ විෂයානුබද්ධ තාක්ෂණික දැනුම පරීක්ෂා කෙරේ. |

| *තනතුර* | *විෂය නිර්දේශය* |
|---|---|
| ප්‍රවාහන නිලධාරි | 1. අමාත්‍යාංශය යටතට ගැනෙන සියලු වාහන අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, පාවිච්චියට නුසුදුසු වාහන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම<br><br>2. වාහන අලුත්වැඩියාවට ඉදිරිපත් කිරීමේ දී වාහනයේ ඇති දෝෂ පිළිබඳ පැහැදිළිව නිගමනය කිරීම<br><br>3. වාහන අලුත්වැඩියාව සම්බන්ධව ගරාජය විසින් ඉදිරිපත් කරන ඇස්තමේන්තු පරීක්ෂා කර බලා අදාළ අලුත්වැඩියාව, අමතර කොටස් යෙදීම හා ඇස්තමේන්තුවේ සඳහන් මිල ගණන් සාධාරණ ද යුක්ති සහගත ද යන බව සෑහීමකට පත්ව එම ඇස්තමේන්තු නිර්දේශ කිරීම<br><br>4. වාහන අලුත්වැඩියාවෙන් පසු එම අලුත්වැඩියාව නිසි පරිදි ඉටුකර තිබේ ද යන්න වාහනය පරීක්ෂා කර බලා බිල්පත් ගෙවීමට ප්‍රථම නිර්දේශ කිරීම<br><br>5. රියදුරන් විසින් වාහනය මනාව නඩත්තු කරන්නේ ද යන වග මාසිකව පරීක්ෂා කර බැලීම හා ඒ සම්බන්ධව අදාළ නිර්දේශයන් උසස් නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම<br><br>6. වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම<br><br>7. වාහන අනතුරකට පත්වූ විට ඒ ගැන පරීක්ෂණ පැවැත්වීම, අලාභය පිළිබඳ වගකීම ගණන් බැලීම<br><br>8. වාහන සේවා කිරීම සඳහා නියමිත කාලය තුළ ඉදිරිපත් කිරීම<br><br>9. වාහන අලුත්වැඩියාවේ අමතර කොටස් යොදා පැරණි කොටස් නිසි පරිදි භාරගෙන ලේඛන ගතකොට ගබඩාව වෙත යැවීම<br><br>10. වාහන ධාවනයේදී ඇති වන අනතුරු ආදියේ දී පවරන නඩුහබ ආදිය සම්බන්ධයෙන්වන සියලු කටයුතු හා ඒ පිළිබඳ ලිපිගොනු පවත්වාගෙන යාම<br><br>11. වාහන රක්ෂණය කිරීම හා අනතුරුවල දී අලාභ ඇතිවූ විට අලාභය නියමිත වශයෙන් අයකර ගැනීමට කටයුතු කිරීම<br><br>ඉහත කාර්යයන්වලට අදාළ NVQ 6 මට්ටමේ දැනුම හා ඉහත කාර්යයන්ට අදාළ විෂයානුබද්ධ තාක්ෂණික දැනුම පරීක්ෂා කෙරේ. |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර | 1. ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ක්‍රියාත්මක කිරීම හා එම උපකරණවල ක්‍රියාකාරීත්වය පිළිබඳ වගකීම<br>2. සංවිධානාත්මක ලෙස ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයක් පවත්වාගෙන යාම හා සියලුම ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ භාරව සිටීම<br><br>3. රාජකාරියට අදාළ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ලබාගැනීමට කටයුතු කිරීම හා ඒකකයට අදාළව ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සඳහා උප ඉන්වෙන්ට්‍රියක් පවත්වාගෙන යාම<br><br>4. උපකරණ, අභ්‍යන්තර හා බාහිර ඉගැන්වීම් අවශ්‍යතා සඳහා හැකි සෑම අවස්ථාවක්ම විධිමත්ව ලබාදීම<br><br>ඉහත කාර්යයන්වලට අදාළ NVQ 6 මට්ටමේ දැනුම හා ඉහත කාර්යයන්ට අදාළ විෂයානුබද්ධ තාක්ෂණික දැනුම පරීක්ෂා කෙරේ. |

09. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

**10. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරන අතර ලකුණු ලබා දෙනු නොලැබේ.

**11.** විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර දෙකට ම පෙනී සිටිය යුතුය.

**12.** මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**13. විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රු.600/=කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(ii) ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Cards)
(iii) ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Bank of Ceylon Online Banking Method)
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

***සැලකිය යුතුය*** : ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

**14.** විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනයන් පමණක් වලංගුය.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි හා විද්‍යුත් සන්නිවේදන උපකරණ පැළඳ නොසිටින බව තහවුරු කර ගැනීම සඳහා මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

15. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා මාර්ගගතව අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ

ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත, සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී /සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

16. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

17. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

18. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනය මගින් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

19. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

නාලක කලුවැව,
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 සැප්තැම්බර් මස 09 .වැනි දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

10 - 08

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේවන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරි (විනය) තනතුරේ පවතින පුරප්පාඩු **10** ක් විවෘත පදනමින් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Applications – Recruitment Exams/ E.B. Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ඔක්තෝබර් මස 07 වැනි දින පෙ.ව. 9.00**ට විවෘත වන අතර **2025 නොවැම්බර් මස 06 වැනි දින රාත්‍රී 9.00**ට අවසන් වේ. **2026 ජනවාරි මස කොළඹ** දී විභාගය පැවැත්වීම සඳහා කටයුතු කරනු ලැබේ.

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. යොමු කරන ලද අයදුම්පත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වාම ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

i) අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක

ඒකාබද්ධ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේදී වැඩිම ලකුණු ලබාගන්නා අපේක්ෂකයන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයකට නොඅඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(ii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු පිරිනමනු ලබන්නේ අංක (8) ඡේදයේ දැක්වෙන පරිදි ලකුණු ලබාදීමේ පරිපාටිය පදනම් කරගෙන වේ.

(iii) පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(iii) තෝරාගන්නා නිලධාරීන් දිවයිනපුරා පිහිටි ඕනෑම බන්ධනාගාර ආයතනයක සේවය කළයුතු අතර අනුයුක්ත කරවන බන්ධනාගාර ආයතනයේ නිල නිවාස පහසුකම් ඇත්නම්, අනිවාර්යයෙන් නිල නිවසේ පදිංචි වී සිටිය යුතුය.

(iv) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතුය.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරි තනතුර සඳහාවන බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි ඇතුළත් කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වේ.

**03. වැටුප් පරිමාණය:**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2025, **රු.82150- 10x2,400- 8x2,940- 17x3,900–රු.195,970/-** ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

**04. සුදුසුකම් :-**

**(අ) අධ්‍යාපන සුදුසුකම් :**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනමන මූලික උපාධියක් තිබීම ;

  හෝ

  ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

- අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

**(ආ) ශාරීරික සුදුසුකම් :**

(i) අවම උස අඩි 5 අඟල් 6 ක් විය යුතුය.
(ii) පපුව හුස්ම නාල්ලා අඟල් 32ක් විය යුතුය.
(iii) මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

**(ඇ) වයස් සීමාව :**

අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි වීම. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**(ඇ) කායික සුදුසුකම් :**

(i) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

(ii) ශාරීරික හා මානසික යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වන අතර මෙම පරීක්ෂණයේදී ඔරොත්තු දීමේ හැකියාව, ශාරීරික හා මානසික යෝග්‍යතාව, දෘෂ්ටිය, ශ්‍රවණය පිළිබඳ සැලකිල්ලට භාජනය කරනු ලැබේ. ස්වභාවික හා කෘත්‍රිම ශාරීරික වෙනස්කම් (පච්ච කෙටීම වැනි) නොතිබිය යුතුය.

**05. වෙනත් සුදුසුකම් :**

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු අතර යහපත් චරිතයකින් ද යුක්ත විය යුතුය. එය පොලිස් නිෂ්කාෂණ වාර්තාවක් මගින් සනාථ කර ගැනීමට කටයුතු කෙරේ.

(ii) චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරුවකු කරනු ලැබීම ඉහත තනතුර සඳහා පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.

(iii) රජයේ නිලධාරියකුවන අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(iv) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, එනම් **2025 නොවැම්බර් මස 06** වැනි දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(v) ආගමික පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට අවසර නොමැත.

**06.** පහත සඳහන් ලිපිලේඛනවලින් කිසිවක් හෝ සියල්ලම හෝ ඉදිරිපත් කරන ලෙස නියම කළවිට ඒවායේ මුල් පිටපත් අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය **(සැ.යු.-** උපකෘත පාඨමාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කර ඇති බෞතීස්ම උප්පැන්න සහතික භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකවල මුල් පිටපත්.

(ඇ) චරිත සහතික 02 ක්.

(ඈ) වෘත්තීය හා/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) ඉංග්‍රීසි භාෂාවෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය

(ඊ) අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කරන හඳුනා ගැනීමේ සහතිකයක්.

**07. විභාග පරිපාටිය**

7.1 ලිඛිත විභාගය:

7.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලැබේ.

7.1.2 විභාගය පිළිබඳ විස්තර :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ. අපේක්ෂකයන් සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතුය.

| *අංකය* | *විෂයයන්* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම<br>I කොටස - බුද්ධි පරීක්ෂණය | මිනිත්තු 45 | 50 | 40% |
| | බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම<br>II කොටස - සාමාන්‍ය දැනීම<br>(අන්තර්ජාතික හා දේශීය දැනුම පරීක්ෂා කරනු ලැබේ) | මිනිත්තු 45 | 50 | 40% |
| 02 | සිද්ධි අධ්‍යයනය (කළමනාකරණ දැනුම පිළිබඳ) | පැය 02 | 100 | 40% |

**7.1.3** විභාගය සඳහා විෂය නිර්දේශය:

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01.බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම<br>I කොටස - බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න ඇතුළත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 01.බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම<br>II කොටස - සාමාන්‍ය දැනීම<br>(අන්තර්ජාතික හා දේශීය දැනුම පරීක්ෂා කරනු ලැබේ) | තොරතුරු තාක්ෂණය, අයදුම්කරු වාසය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද දේශීයව හා අන්තර්ජාතිකව වැදගත්වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ සාමාන්‍ය දැනීම ප්‍රශ්න ද ඇතුළත්ව මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විතවනු ඇත. |
| 02.සිද්ධි අධ්‍යයනය (කළමනාකරණ දැනුම පිළිබඳ) | පිරිස් පාලනය, ආයතන කළමනාකරණය, සුභසාධක කටයුතු, කෘෂිකර්ම කටයුතු, පුනරුත්ථාපන කටයුතු හා සුළු කර්මාන්ත නිෂ්පාදන කටයුතු පිළිබඳව සිද්ධි අධ්‍යයන ප්‍රශ්න 04 කින් සමන්විත වේ. |

**7.1.4** ප්‍රතිඵල නිකුත් කිරීම:

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දැනුම් දීම පරිදි විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම කරනු ඇත.

**08. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පහත දැක්වෙන ලකුණු ලබාදීමේ පරිපාටියට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. එහිදී උපරිම ලකුණු 100 ක් පිරිනමනු ලැබේ.

| *අනු. අංකය* | *සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | **20** |
| | (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන පශ්චාත් උපාධියක් සඳහා ; | 20 | |
| | (ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් සඳහා ; | 15 | |
| | (iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමන අවුරුද්දක් හෝ ඊට වැඩි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ; | 10 | |
| | (iv) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමන ඩිප්ලෝමා / සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා. | 06 | |

| අනු. අංකය | සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | (v) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමන ලද - | | |
| | විශේෂ උපාධියක් සඳහා ; | 12 | |
| | පළමු පන්තියේ සාමාර්ථයක් සහිත සාමාන්‍ය උපාධියක් සඳහා ; | 10 | |
| | දෙවන පන්තියේ ඉහළ පෙළ සාමාර්ථය සහිත සාමාන්‍ය උපාධියක් සඳහා ; | 08 | |
| | දෙවන පන්තියේ පහළ පෙළ සාමාර්ථය සහිත සාමාන්‍ය උපාධියක් සඳහා ; | 06 | |
| | (ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |
| 02 | **භාෂා ප්‍රවීණතාව :** | | **10** |
| | **A. ඉංග්‍රීසි භාෂාව -** | | |
| | (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් SLQF 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින්/ රජයේ පිළිගත් ආයතනයකින් අවම වශයෙන් වසරක් හෝ අධ්‍යයන පැය 1500 ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඩිප්ලෝමාවක් ; | 05 | |
| | (ii) රජයේ පිළිගත් ආයතනයකින් ලබාදෙන මාස 06 ක් හෝ පැය 720 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ; | 04 | |
| | (iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා IELTS සමස්ථ ලකුණ 6.5 හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ වීම ; | 04 | |
| | (iv) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක් ; | 02 | |
| | (v) රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් වෙනත් සහතික පත්‍රයක් සඳහා. | 01 | |
| | **B. අනෙක් රාජ්‍ය භාෂා (සිංහල/දෙමළ) -** | | |
| | (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ ආයතනයකින් ලබාදෙන මාස 06 ක් හෝ පැය 720 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ; | 05 | |
| | (ii) රජයේ පිළිගත් ආයතනයකින් ලබාදෙන මාස 03 ට හෝ පැය 360ට නොඅඩු සහතික පත්‍රයක් සඳහා ; | 04 | |

| *අනු. අංකය* | *සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| | (iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) පළමු භාෂාව ලෙස සිංහල හා දෙමළ භාෂා සඳහා පහත පරිදි සාමාර්ථයය ලබා තිබීම. (භාෂා 02 සඳහාම ලබා ඇති සාමාර්ථයන්ගෙන් අඩු සාමාර්ථය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.) ; | | |
| | විශිෂ්ට සාමාර්ථය | 05 | |
| | අධි සාමාර්ථය | 04 | |
| | සම්මාන සාමාර්ථය | 03 | |
| | සාමාන්‍ය සාමාර්ථය | 02 | |
| | (iv) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) දෙවන භාෂාව ලෙස සිංහල හෝ දෙමළ භාෂාව සඳහා පහත පරිදි සාමාර්ථයය ලබා තිබීම. (පළමු භාෂාව ලෙස සමත්ව ඇති භාෂාව නොවන දෙවන භාෂාව සඳහා පමණි.) | | |
| | විශිෂ්ට සාමාර්ථය | 03 | |
| | අධි සාමාර්ථය / සම්මාන සාමාර්ථය | 02 | |
| | සාමාන්‍ය සාමාර්ථය | 01 | |
| | *(භාෂා ප්‍රවීණතාව යටතේ A හා B). සඳහා ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)* | | |
| 03 | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම -** | | **10** |
| | (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ වෙනත් රජයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් ; | 10 | |
| | (ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් ; | 06 | |
| | (iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා / පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබාගත් සහතික පත්‍ර. (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.) | 04 | |
| | *(ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)* | | |

| *අනු. අංකය* | *සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 04 | **ක්‍රීඩා කුසලතා** | | **20** |
| | I. ජාත්‍යන්තර ක්‍රීඩා තරගවල දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම | 10 | |
| | II. සමස්ත ලංකා මට්ටමේ ජයග්‍රහණ | 08 | |
| | III. පළාත් මට්ටමේ ජයග්‍රහණ | 05 | |
| | IV. දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණ | 03 | |
| | V. කොට්ඨාස මට්ටමේ ජයග්‍රහණ | 02 | |
| | VI. අන්තර් විශ්වවිද්‍යාල ජයග්‍රහණ | 02 | |
| | VII. පාසල් මට්ටමේ ජයග්‍රහණ | 02 | |
| | (එක් ක්‍රීඩාවක උපරිමය සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |
| 05 | **නායකත්වය හා ප්‍රජා සේවා කටයුතු** | | **20** |
| | ශිෂ්‍යභට කණ්ඩායමේ සැරයන් හෝ ඊට ඉහළ තනතුරක් දැරීම | 06 | |
| | ජනාධිපති බාලදක්ෂයකු වීම | 06 | |
| | පාසල් ප්‍රධාන ශිෂ්‍ය නායක වීම | 06 | |
| | තූර්ය වාදක කණ්ඩායමේ නායක | 06 | |
| | ශිෂ්‍යභට කණ්ඩායමේ සාමාජිකයකු වීම | 03 | |
| | බාලදක්ෂ කණ්ඩායමේ සාමාජිකයකු වීම | 03 | |
| | ශිෂ්‍ය නායකයකු වීම | 03 | |
| | තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකයකු වීම | 03 | |
| | ප්‍රධාන ක්‍රීඩා නායක | 03 | |
| | දහම් පාසල් ශිෂ්‍ය නායක | 03 | |
| | සෞඛ්‍යදාන / ශාන්ත ගිලන් රථ සේවා/ රතු කුරුස ප්‍රථමාධාර සාමාජිකයකු වීම | 03 | |
| | යොවුන් සේනාංක සාමාජිකයකු වීම | 03 | |
| | දහම් පාසල් අවසාන විභාගය සමත් වීම | 03 | |
| | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සලකා බලන වෙනත් විශේෂ සුදුසුකම් | 03 | |
| | (*සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් සටහන් තැබිය යුතුය.*) | | |
| 06 | **විශේෂ දක්ෂතා හා කුසලතා** | | **10** |
| | (අනු අංක 04 සහ 05 යටතේ නොගැනෙන වෙනත් දක්ෂතා සහ කුසලතා පමණක් සලකා බලනු ලැබේ.) | | |
| | සමස්ත ලංකා මට්ටමේ ජයග්‍රහණ | 06 | |
| | පළාත් මට්ටමේ ජයග්‍රහණ | 05 | |
| | දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණ | 04 | |
| | වෙනත් ජයග්‍රහණ | 03 | |
| | (එක් ඉසව්වක උපරිමය සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |

| අනු. අංකය | සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 07 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | | 10 |
| | නායකත්ව හා සන්නිවේදන කුසලතා<br>තාර්කික චින්තනය<br>වෘත්තීය ආචාර ධර්ම පිළිබඳ ආකල්ප | 05<br>02<br>03 | |
| | | මුළු ලකුණු | 100 |

*සටහන* : කිසියම් සුදුසුකමක් සඳහා එක් ශීර්ෂයක් යටතේ පමණක් ලකුණු පිරිනමනු ලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සහතික පත්‍ර සමඟ එහි කාල සීමාව/ SLQF මට්ටම/ NVQ මට්ටම සනාථ කිරීමට අදාළ ලේඛන ද ඉදිරිපත් කළ යුතු වේ.

**09. විභාග කොන්දේසි :**

I. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්නපත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතුය.

II. විභාග ගාස්තුව රු.1,200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය :-

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් ;
(Any Bank Credit Card)

(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් ;
(Any Bank Debit Card with the Facility of Internet Transactions)

(iii) ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් ;
(Bank of Ceylon Online Banking Method)

(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් ;
(Bank of Ceylon Teller Slip Payment)

*සටහන* :-

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත ;

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ ;

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

III. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන* : ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භවන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

IV. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත්

කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින යම්කිසි තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල් වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පත අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

V. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

VI. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත ;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය ;

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව හා විද්‍යුත් සංනිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණු ආවරණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙක් හෝ ලවා සහතික කරවා ගත යුතුය.

**10. සාවද්‍ය තොරතුරු සැපයීම :**

යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

**11.** මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
අධිකරණ සහ ජාතික
ඒකාබද්ධතා අමාත්‍යාංශය.

2025 සැප්තැම්බර් මස 29 වැනි දින.

10 - 66

## කම්කරු දෙපාර්තමේන්තුව

### අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025 වර්ෂය

කම්කරු දෙපාර්තමේන්තුවෙහි 2024.12.31 පුරප්පාඩුව පවත්නා අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ පහත සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් **2025.10.24** දිනට පහත 3.0 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.0** *බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු සහ පුරප්පාඩු සංඛ්‍යාව* **:**

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 1 | සැලසුම් ශිල්පී | 3 |
| 2 | තාක්ෂණ නිලධාරි (සිවිල්) | 1 |
| 3 | තාක්ෂණ නිලධාරි (විදුලි) | 1 |

1.1 *තනතුරෙහි / තනතුරුවල ස්වභාවය*: ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.)

1.2 *තනතුරුවල රාජකාරී ස්වභාවය* -

| | *අනුමත තනතුරු නාම* | *කාර්යයන්* |
|---|---|---|
| 1 | සැලසුම් ශිල්පී | ඉංජිනේරු විසින් සකස් කරන සැලසුම් ඇඳීම, ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| 2 | තාක්ෂණ නිලධාරි (සිවිල්) | කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි හා කම්කරු දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය වශයෙන් පිහිටා ඇති කම්කරු කාර්යාලවල අලුත්වැඩියා කටයුතු, නව ඉදිකිරීම්වල අධීක්ෂණ කටයුතු, ඇස්තමේන්තු සැකසීම, කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ පරීක්ෂා කිරීම, ප්‍රමාණ බිල්පත් සකස් කිරීම, කාර්මික නිලධාරින්ගේ වැඩ අධීක්ෂණය කිරීම සහ ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| 3 | තාක්ෂණ නිලධාරි (විදුලි) | නව විදුලි පද්ධති සකස් කිරීමට අදාළව ඇස්තමේන්තු සකස් කිරීම, නව වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීමට අදාළව ඇස්තමේන්තු සකස් කිරීම සහ වායු සමීකරණ නඩත්තු හා සේවා කටයුතු, විදුලි පද්ධති පිළිබඳ පරීක්ෂා කර බැලීම, ඉහත කටයුතු නවීකරණයට අදාළ ඇස්තමේන්තු සකස් කිරීම, විදුලි ජනක යන්ත්‍ර පරීක්ෂා කිරීම සහ විදුලි උපකරණවල ඇතිවන දෝෂ විදුලි කාර්මික සමග පරීක්ෂා කර ඉංජිනේරු වෙත වාර්තා සැපයීම, ගොඩනැගිල්ලෙහි සවිකර ඇති ගිනි නිවන උපකරණ පිළිබඳව අදාළ කටයුතු පරීක්ෂා කිරීම හා ඒවායේ සේවා කිරීම්වල දී පරීක්ෂා කිරීම, ශබ්ද විකාශන යන්ත්‍ර සහ දුරකතන ජාල පරීක්ෂා කටයුතු සිදු කිරීම , දෙපාර්තමේන්තුව තුළ බාහිර ආයතනවලින් කරන විදුලි කාර්මික වැඩ පරීක්ෂා කිරීම, දිස්ත්‍රික් කාර්යාලවල නඩත්තු හා සේවා කටයුතු පරීක්ෂා කිරීම , ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |

## 2.0 *බඳවා ගැනීමේ ක්‍රමය :*

2.1 ඉහත තනතුරු සඳහා බඳවා ගැනීමේ දී, අයදුම්කරුවන්ගේ සුදුසුකම් අනුව ශ්‍රේණි 3 කට වෙන් කර ඇත. එනම්,
පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය),
පුහුණු ශ්‍රේණිය (වසරක පුහුණු කාලය) හා
III ශ්‍රේණිය (ඍජු බඳවා ගැනීම) වේ. එක් එක් ශ්‍රේණියට අදාළ සුදුසුකම් 3.0 යටතේ දක්වා ඇති අතර අයදුම්කරුවන් විසින් තමා අයදුම් කරන ශ්‍රේණිය කුමක්ද යන්න අයදුම්පතෙහි පැහැදිළිව ම සඳහන් කළ යුතු වේ.

2.2 මෙම වගන්තිය යටතේ පහතින් දක්වා ඇති කොන්දේසිවලට යටත්ව (ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත) පළමුව III ශ්‍රේණියට ද (ඍජු බඳවා ගැනීමට), දෙවනුව පුහුණු ශ්‍රේණියට (වසරක පුහුණු කාලයකට) ද සහ තෙවනුව පුහුණු ශ්‍රේණියට (දෙවසරක පුහුණු කාලයකට) ද බඳවා ගනු ලැබේ.

2.2.1 III ශ්‍රේණියට (ඍජු බඳවා ගැනීම) යටතේ අයදුම්කල අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2.2 III ශ්‍රේණියට ඍජුව බඳවා ගැනීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණිය (වසරක පුහුණු කාලයට) යටතේ අයදුම් කළ අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2.3 ඉහත 2.2.1 හා 2.2.2 ට අදාළව සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලයට) අදාළව සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.3 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය*: අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාවය හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා වන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

## 3.0 *සුදුසුකම් :*

බඳවා ගන්නා ශ්‍රේණිවලට අදාළ සුදුසුකම් පහතින් දක්වා ඇත.

3.1 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

3.1.1 *පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය)*

(අ) අධ්‍යාපන සුදුසුකම් :

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත්ව තිබීම ;

*සහ*

ගණිතය (ශුද්ධ ගණිතය / ව්‍යවහාරික ගණිතය /සංයුක්ත ගණිතය) / ජීව විද්‍යාව (සත්ව විද්‍යාව / උද්භිද විද්‍යාව), භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ තාක්ෂණවේදය (ජෛව පද්ධති තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය, විද්‍යා තාක්ෂණය) යන විෂයයන්ගෙන් විෂයයන් 2 ක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

3.1.2 *පුහුණු ශ්‍රේණිය: (එක් වසරක පුහුණු කාලය)*

*(අ) අධ්‍යාපන සුදුසුකම්* :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත්ව තිබීම ;

සහ

ගණිතය (ශුද්ධ ගණිතය / ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය) / ජීව විද්‍යාව (සත්ව විද්‍යාව / උද්භිද විද්‍යාව), භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් 2ක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

*(ආ) වෘත්තීය සුදුසුකම්* :

(i) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම.
(උදාහරණ: ජාතික තාක්ෂණ සහතිකය සිවිල් / විදුලි / යාන්ත්‍රික);

*හෝ*

(ii) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;

*හෝ*

(iii) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක ක්ෂේත්‍රයට අදාළ කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;

*හෝ*

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

3.1.3 III ශ්‍රේණිය (ඍජු බඳවා ගැනීම)

*(අ) අධ්‍යාපන සුදුසුකම් :*

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා / පෙළ) විභාගය සමත්ව තිබීම ;

*සහ*

ගණිතය (ශුද්ධ ගණිතය / ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය) / ජීව විද්‍යාව (සත්ත්ව විද්‍යාව / උද්භිද විද්‍යාව), භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් 2 ක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

*(ආ) වෘත්තීය සුදුසුකම් :*

පහත සඳහන් සුදුසුකම්වලින් එක් සුදුසුකමක් හෝ සම්පූර්ණ කර තිබිය යුතුය.

(i) මොරටුව විශ්වවිද්‍යාලයෙන් හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව ;

*හෝ*

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව ;

*හෝ*

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව ;

*හෝ*

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ;

*හෝ*

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.

*හෝ*

(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*3.2 කායික සුදුසුකම් :*

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3.3 *වෙනත් සුදුසුකම් :*

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය,
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය,
III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි,
IV. සේවයට බඳවා ගැනීම සඳහාවන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**4.0 වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**5.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි;**

5.1 පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කර ගනු ලබන අයදුම්කරුවන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන ආයතනයක අදාළ පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

5.2 පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත්වන ආධුනිකයන් වෙතොත් ඔවුන්ට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත්වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

5.3 විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධරයෙකු වසර 03 ක පරිවාස කාලයකට යටත්වේ. ඔහු / ඇය පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව සහ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇත්නම් හා ඔහු / ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් ඔහු / ඇය පරිවාස කාලය අවසානයේ ස්ථිර කරනු ලැබේ.

5.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 03ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතුය.

5.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට හා ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අංක 1930/12 දරන 2015 සැප්තැම්බර් මස 01 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රය මගින් පළ කරන ලද සේවා ව්‍යවස්ථාවට හා 2017.03.07 වන දින හා එහි සංශෝධන 2018.03.20 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පරිපාටියට හා සේවා ව්‍යවස්ථාවට මින් මතු කෙරෙන සංශෝධනවලට ද මෙම පත්වීම යටත් වේ.

**6.0 වැටුප් පරිමාණය :**

6.1 III ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන වැටුප් චක්‍රලේඛයෙහි MN – 3 - 2025 අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් ප්‍රමාණය

**රු. 52,250 – 10×800 - 11×1,190 - 10×1,320 – 10×1,350 - රු. 100,040/- වේ.**

6.2 පුහුණු කිරීමේ ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව දීමනාව

1 වසර - රු. 41,317.00
2 වසර - රු. 41,689.00

**7.0 ලිඛිත විභාගය :**

(*අ*) ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 1/2 යි | 100 | 40 |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 2 යි | 100 | 40 |

(*ආ*) සියලුම අපේක්ෂකයින් ප්‍රශ්න පත්‍ර දෙකට ම පෙනී සිටිය යුතුය. බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය සඳහා සියලුම අපේක්ෂකයින් පෙනී සිටිය යුතු අතර, විෂයානුබද්ධ තාක්ෂණ පරීක්ෂණය අපේක්ෂකයින් විසින් ඉල්ලුම් කරන තනතුර අනුව වෙනස්වන අතර එක් එක් තනතුරට අදාළ විෂය නිර්දේශය අනු අංක 8.0 මගින් දක්වා ඇත.

(*ඇ*) පුරප්පාඩු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මකවන දිනය කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

8.0 ලිඛිත විභාගය සඳහාවන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූලභාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | **(අ) සැලසුම් ශිල්පී -**<br>i. ඇස්තමේන්තු සැලසුම් කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳ දැනුම.<br>ii. සැලසුම් ඇඳීම හා උපකරණ පිළිබඳ අවබෝධය, ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ දැනුම.<br><br>**(ආ) තාක්ෂණ නිලධාරි (සිවිල්) -**<br>i. ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තුව පිළිබඳ දැනුම<br>ii. ප්‍රමාණ ගැනීම හා ඇස්තමේන්තු සැකසීම / මිමි ගැනීම හා මට්ටම් ගැනීම පිළිබඳ දැනුම<br><br>**(ඇ) තාක්ෂණ නිලධාරි (විදුලි) -**<br>i. විදුලි සැපයුම/ විදුලි පරිපථ පිළිබඳ දැනුම |

**9.0 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර ලකුණු ලබා දෙනු නොලැබේ.

***සැලකිය යුතුයි**

සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

**10.0 විභාග ගාස්තුව :**

මෙම විභාගය සඳහා ගාස්තුව රු. 500/- කි . එම විභාග ගාස්තුව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා නමින් ඇති මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086100169026274 දරන ගිණුමට බැර කර ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතුය.

**(මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)**

> *සටහන* :- විභාගය අවලංගු කළහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ.මෙම විභාගය සඳහා ගෙවනු ලැබූ විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය.

11.0 අයදුම්කිරීමේ ක්‍රමය :

11.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී 21 × 29 (A4) ප්‍රමාණයේ කඩදාසි වල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතුය. අංක 1.0 සිට 7.0 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 08.0 සිට 12.1 දක්වා 02 පිටුවේ ද, අංක 12.2 සිට 13.0 දක්වා 03 පිටුවේ ද, අංක 14.0 සිට 17.0 දක්වා 04 පිටුවේ ද, අංක 18.0 , 05 පිටුවේ ද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

11.2 අයදුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

11.3 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.4 මෙම විභාගය **නොවැම්බර් මස කොළඹ** නගරයේ පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවල පමණක් පැවැත්වේ.

11.5 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපැලේ දී අස්ථාන ගතවන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

11.6 තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

11.7 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහල කෙළවරේ ඔබ ඉල්ලුම් කරන තනතුර අනුව **"කම්කරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ.......................................... තනතුරට බඳවා ගැනීම - විවෘත තරග විභාගය"** යනුවෙන්

පැහැදිළිව සඳහන් කළ යුතුය. (අයදුම් කරන තනතුර හිස්තැනට ඇතුළත් කරන්න. )

11.8 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්වයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිබලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06 / 2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.9 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සතු වන්නේ ය.

**12.0 අයදුම්පත යොමු කිරීම :**

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2025.10.24** වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

කම්කරු කොමසාරිස් (පාලන).
කම්කරු දෙපාර්තමේන්තුව,
08 වන මහල,
" මෙහෙවර පියෙස" ගොඩනැගිල්ල,
කොළඹ 05.

**13.0 විභාගයට පෙනී සිටීම :**

(*අ*) සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති, නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් හට පමණක් විභාගය පවත්වන දිනට සතියකට කලින් ලැබෙන සේ ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් ප්‍රවේශ පත්‍ර තැපෑලෙන් නිකුත් කරනු ඇත.

(*ආ*) අපේක්ෂකයින් හට තමා විසින් ලබා දී ඇති ජංගම දුරකතන අංකය වෙත කෙටි පණිවිඩයක් හරහා ද ප්‍රවේශ පත්‍රය බාගත කර ගැනීම සඳහා සබැඳියක් (Link) සපයනු ලැබේ. එමගින් අපේක්ෂකයන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර ප්‍රවේශ පත්‍රය බාගත කර ගැනීමේ හැකියාව පවතී. යම් අපේක්ෂකයෙකු වෙත ප්‍රවේශ පත්‍රය තැපෑලෙන් නොලැබුනහොත් මෙසේ බාගත කර ගැනීමේ හැකියාව පවතී. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිඳු අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ඇ*) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකු ම විභාගය පවත්වන දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය.

**14.0 අපේක්ෂකයාගේ අනන්‍යතාවය :**

විභාග ශාලාවේ දී තමා පෙනී සිටින විෂයයන් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය.

**15.0 සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

යම් අපේක්ෂකයෙකුට මෙම ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

16.0 මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,
කම්කරු කොමසාරිස් ජනරාල්.

කම්කරු දෙපාර්තමේන්තුව.
2025 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ 05.

ආදර්ශ අයදුම් පත්‍රය

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**කම්කරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවයේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න. අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.)

02. 2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : ...........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ (SILVA A.B.D.P.A.)

2.2 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ...........................................................................................
..................................................................................................................................................

2.3 සම්පූර්ණ නම : (සිංහලෙන් / දෙමළෙන්) : ...................................................................................................
..................................................................................................................................................

03. 3.1 ස්ථිර ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)
..................................................................................................................................................
..................................................................................................................................................

3.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : .........................................................................................................
..................................................................................................................................................

04. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - 0, ස්ත්‍රී - 1_
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

06. විවාහක/අවිවාහක බව : (අවිවාහක - 1, විවාහක - 2)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න )

07. 7.1 උපන් දිනය : අවුරුද්ද | | | | මාසය | | | දිනය | | |

7.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2025.10.24 දිනට) වයස:

අවුරුදු | | | මාස | | | දින | | |

08. ජංගම දුරකථන අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

09. විද්‍යුත් තැපැල් ලිපිනය:

10. අයදුම් කරන තනතුර (ඉදිරියෙන් (√) ලකුණ යොදන්න)

| *අනු අංකය* | *තනතුරු නාමය* | |
|---|---|---|
| 1 | සැලසුම් ශිල්පී | |
| 2 | තාක්ෂණ නිලධාරි (සිවිල්) | |
| 3 | තාක්ෂණ නිලධාරි (විදුලි) | |

11. *ගැසට්* නිවේදනයේ 3.0 ඡේදය අනුව අයදුම් කරන ශ්‍රේණිය (ඉදිරියෙන් √ ලකුණ යොදන්න)

| | | |
|---|---|---|
| 1 | පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) | |
| 2 | පුහුණු ශ්‍රේණිය ( වසරක පුහුණු කාලය) | |
| 3 | III ශ්‍රේණිය (සෘජු බඳවා ගැනීම්) | |

12. අධ්‍යාපන සුදුසුකම්:

12.1 අ.පො.ස. (සා / පෙළ) විභාගය පිළිබඳ : (පළමුවර)

(i) විභාගයේ වර්ෂය හා මාසය :- …………………………….

(ii) විභාග අංකය : - …………………………….

(iii) ප්‍රතිඵල :

| | *විෂයය* | *ශ්‍රේණිය* | | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

12.2 අ.පො.ස. (සා / පෙළ) විභාගය පිළිබඳ : (දෙවන වර)

(i) විභාගයේ වර්ෂය හා මාසය : - …………………………….

(ii) විභාග අංකය : - …………………………….

(iii) ප්‍රතිඵල

| | විෂයය | ශ්‍රේණිය | | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

12.3 අ.පො.ස. (උ / පෙළ) විභාගය :

(i) විභාගයේ වර්ෂය හා මාසය : - …………………………….

(ii) විභාග අංකය : - …………………………….

(iii) ප්‍රතිඵල :

| | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

13. වෘත්තීය සුදුසුකම් :

| හදාරා ඇති පාඨමාලාව | පිරිනමනු ලැබූ ආයතනය | හදාරන ලද කාල සීමාව | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

14. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත්ද ? ..........................................................................................

එසේ නම්, ඒ පිළිබඳව විස්තර : ..........................................................................................

..........................................................................................

15. ඔබ මීට පෙර රජයේ සේවයේ යෙදී සිටිය දී සේවය අවසන් කර තිබේද ? ..........................................................................................

එසේ නම්, එම විස්තර සහ සේවය අවසන් කිරීමට හේතු : ..........................................................................................

..........................................................................................

16. විභාග ගාස්තු ගෙවීම :-

16.1 ගෙවූ මුදල : ..........................................................................................

16.2 ගෙවන ලද බැංකුව : ..........................................................................................

16.3 ගෙවූ දිනය : ..........................................................................................

16.4 ලදුපත් අංකය : ..........................................................................................

| |
|---|
| *ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.*<br>*(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)* |

17. අයදුම්කරුගේ සහතිකය :

*ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව විවෘත තරග විභාගයට පෙනී සිටීමට .............................................. ..........................................................................වන මම සුදුස්සෙකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පටිපාටිය අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ කිසිදු වන්දියක් නොගෙවා, මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි. මම මෙම තනතුරට තෝරා පත් කර ගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට එකඟ වෙමි.

...................................................                ...........................................................,

දිනය                අයදුම්කරුගේ අත්සන.

18. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (*ගැසට් නිවේදනයේ* 11.7 ඡේදය පරිදි විය යුතුය)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .............................................................................................. (අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්,......................... දින ඔහුගේ / ඇයගේ අත්සන මා ඉදිරියේ දී තබන ලද බවත් මම සහතික කරමි.

දිනය : .......................................

..............................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .........................................................................

තනතුර : .........................................................................................................................................

ලිපිනය : .........................................................................................................................................

(නිල මුද්‍රාවකින් සහතික කළ යුතුය)

10 - 67

**ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි**

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **ඔක්තෝබර්** | 2025.10.03 | සිකුරාදා | 2025.09.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.10 | සිකුරාදා | 2025.09.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.17 | සිකුරාදා | 2025.10.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.24 | සිකුරාදා | 2025.10.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.31 | සිකුරාදා | 2025.10.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2025.11.07 | සිකුරාදා | 2025.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.14 | සිකුරාදා | 2025.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.21 | සිකුරාදා | 2025.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.28 | සිකුරාදා | 2025.11.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2025.12.05 | සිකුරාදා | 2025.11.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.12.12 | සිකුරාදා | 2025.11.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.12.19 | සිකුරාදා | 2025.12.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.12.26 | සිකුරාදා | 2025.12.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.